| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| පුරවැසි අධ්‍යාපනය | 07 ශ්‍රේණිය | කාලය පැය. 02 යි |

නම: ...............................................................

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

1) සමාජයේ පැවැත්මට අවශ්‍ය පුද්ගලයින් බිහිකරන ප්‍රධාන මූලය වන්නේ,

   i. පවුලයි  ii. පාසලයි
   iii. ආගමික ආයතනයි.  iv. සමාජ ආයතනයි

2) ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකමක් නොවන්නේ,

   i. ජීවත්වීමේ අයිතිය.  ii. අධ්‍යාපනය ලැබීමේ අයිතිය.
   iii. ඡන්ද අයිතිය.  iv. කැමති ආගමක් ඇදහීමේ අයිතිය.

3) ඔබ සතු උතුම් ගුණාංගයකි,

   i. හොඳින් ඉගෙනීම.  ii. පරාර්ථකාමී බව.
   iii. අන් අයගේ සිත් රිදවීම.  iv ආත්මාර්ථය.

4) ශ්‍රී ලංකාව තුළ අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව වන්නේ,

   i. අවුරුදු 15.  ii. අවුරුදු 14.  iii. අවුරුදු 10  iv. අවුරුදු 18

5) රජයේ සේවකයෙකුගේ සේවා කාලය උපරිම වයස් සීමාව,

   i. අවුරුදු 57 දක්වා.  ii. අවුරුදු 60 දක්වා
   iii. අවුරුදු 50 දක්වා  iv. අවුරුදු 55 දක්වා.

- **හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

  **(අයිතිවාසිකමකි, සම්ප්‍රදායන්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, විනයවත් කිරීම, අභියෝගාත්මක, යුතුකමකි, ග්‍රහලෝකාගාරය.)**

6) ..................................................... දෛනිකව අපට අත්‍යවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ආයතනයකි.

7) අධ්‍යාපනය ලැබීම ඔබ සතු ..............................................................

8) ආගමික සංවිධාන සමාජය .......................................................... දායක වේ.

9) දීර්ඝකාලයක් තිස්සේ පැවත ගෙන එන සිරිත් විරිත්, චාරිත්‍ර ආදිය ........................................................වේ.

10) විභාගවලට මුහුණ දීම පාසල් ශිෂ්‍යයින් වන අපට මුහුණ දීමට සිදුවන ..................................................... අවස්ථාවකි.

- **පහත සඳහන් ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

11) ජනමාධ්‍ය නිරතුරුව මිනිසාට අවශ්‍ය වන දත්ත හා තොරතුරු ඉදිරිපත් කරයි. ( )

12) අභියෝගයක දී ජීවිතයෙන් පළා යාම නිර්භීත ක්‍රියාවකි. ( )

13) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මිනිසුන්ගේ අයිතිවාසිකම් සුරැකීමට කටයුතු කරයි. ( )

14) ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීම නීතියෙන් දඬුවම් ලැබිය යුතු වරදකි. ( )

15) දෙමව්පියන්ට නොසැලකීම සදාචාරාත්මක යුතුකම් ඉටු කිරීමකි. ( )

- **A තීරුවේ ඔබේ පියාගේ හා මවගේ ඥාතීන් දක්වන අතර B තීරුවේ ඔබට ඇති ඥාතීත්වය දැක්වේ. A හා B තීරු නිවැරදිව ගලපා යා කරන්න.**

| | |
|---|---|
| 16) පියාගේ අයියාගේ බිරිඳ | මාමා |
| 17) ඔබේ මවගේ මල්ලි | ලොකුඅම්මා |
| 18) ඔබේ පියාගේ අයියා | මස්සිනා |
| 19) ඔබේ මවගේ අයියාගේ බිරිඳ | මහප්පා |
| 20) ඔබේ මවගේ මල්ලීගේ පුතා | නැන්දා |

(ල. 2x20=40)

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

1)

i. පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට හිමිවිය යුතු අයිතිවාසිකම් 2 ක් ලියන්න. (ල. 02)

ii. එම අයිතිවාසිකම් ලබන ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් 2 ක් ලියන්න. (ල. 02)

iii. ජනතාවට තොරතුරු ලබා දෙන මාධ්‍ය 02 ක් නම් කරන්න. (ල. 02)

iv. ඔබ අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථා 02 ක් ලියන්න. (ල. 02)

v. යහපත් පුරවැසියෙකු ලෙස ඔබ සතු විය යුතු ගුණාංග 02 ක් ලියන්න. (ල. 02)

vi. පවුලේ සමාජිකයෙකු ලෙස ජීවත්වීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල. 03)

vii. මව්පියන් වෙනුවෙන් ඔබ විසින් ඉටු කළ යුතු යුතුකම් 03 ක් ලියන්න. (ල. 03)

2)

i. දෙමව්පියන්ගෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් 02 ක් ලියන්න. (ල. 02)

ii. ජන සමාජය අන්තර් සබඳතා පවත්වන සමිති සමාගම් 05 ක් ලියන්න. (ල. 05)

iii. සමාජයේ පවතින දේශපාලන අයිතිවාසිකම් 04 ක් ලියන්න. (ල. 04)

3)

i. වෘත්තිකයින්ගේ රැකියා පිළිබඳ දක්වා ඇති විශ්ව ප්‍රකාශනය කුමක්ද? (ල. 02)

ii. වෘත්තිකයින්ගේ රැකියා සුරක්ෂිත කිරීමට යොදා ඇති විධි විධාන 04 ක් ලියන්න. (ල. 04)

iii. ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඇතිවිය හැකි බලපෑම් 05 ක් ලියන්න. (ල. 05)

4)

i. වර්තමාන ලෝකයේ බොහෝ සාමාජිකයින් මුහුණ දෙන අභියෝගාත්මක අවස්ථා තුනක් ලියන්න.

ii. අභියෝගවලට සාර්ථකව මුහුණදීමට ඔබ විසින් ඇති කරගත යුතු ගුණාංග 04 ක් ලියන්න. (ල. 04)

iii. අභියෝග ජය ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 04 ක් ලියන්න. (ල. 04)

5)

i. ජන සමාජයේ යහපතට හේතු වී ඇති යුතුකම් වර්ග මොනවාද? (ල. 02)

ii. සමාජයේ ජීවත්වන පුරවැසියන්ට පැවරී ඇති වගකීම් 04 ක් ලියන්න. (ල. 04)

iii. යුතුකම් හා වගකීම් ඉටුකිරීම සමාජ යහපතට හේතුවන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

6)

i. දරුවන් රැකියාවල යෙදවීමට බලපාන හේතු 02 ක් ලියන්න. (ල. 02)

ii. ළමා ශ්‍රමිකයින් සම්බන්ධව සමාජ වගකීම් 04 ක් ලියන්න. (ල. 04)

iii. සේවක නීති නිසිපරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇති විය හැකි අවාසි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)